# ප්‍රසම්පාදන දැන්වීමයි

**සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ වනිතා**

**කටයුතු අමාත්‍යාංශය.**

## සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභා සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සහ වනිතා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් කර්මාන්ත ඉටුකිරීම සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | විධායක ඉංජිනේරු කොට්ඨාශය | වැඩ විස්තරය | ලියාපදිංචි ශ්‍රේණිය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු |
|---|---|---|---|---|
| HM/2011/05 | කෑගල්ල | කෑගල්ල ආයුර්වේද රෝහලේ වාට්ටු අංක 1,2,5 හි සිවිලිම සකස් කිරීම | C 9 | රු.1,500.00 |
| HM/2011/06 | කෑගල්ල | මකුද්දල ආයුර්වේද රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරය ඉදිකිරීම | C 9 | රු.1,500.00 |
| HM/2011/07 | කෑගල්ල | නාරංගොඩ මධ්‍යම බෙහෙත් ශාලාවේ සහකාර වෛද්‍ය නිළනිවස අළුත්වැඩියාව | C 9 | රු.1,500.00 |
| HM/2011/08 | කෑගල්ල | නියදුරුපොල මධ්‍යම බෙහෙත් ශාලාව අළුත්වැඩියාව | C 9 | රු.1,500.00 |
| HM/2011/09 | කෑගල්ල | බෙලිගල ග්‍රාමීය රෝහලේ බාහිර රෝගී අංශය හා හදිසි ප්‍රතිකාර ඒකකය අළුත්වැඩියාව | C 8 | රු.2,000.00 |
| HM/2011/10 | කෑගල්ල | උදුගොඩ රෝහලේ ප්‍රවේශ මාර්ගය තැනීම | C 8 | රු.2,000.00 |
| HM/2011/11 | දෙහිඕවිට | කරවනැල්ල මූලික රෝහලේ එක්ස් කිරණ කාමරය වැඩිදියුණු කිරීම | C 8 | රු.2,000.00 |
| HM/2011/12 | දෙහිඕවිට | කරවනැල්ල මූලික රෝහලේ මුළුතැන්ගෙය අළුත්වැඩියාව | C 9 | රු.1,500.00 |
| HM/2011/13 | රඹුක්කන | මාවනැල්ල මූලික රෝහලේ ළය චිකිත්සාගාරය ඉදිකිරීම | C 9 | රු.1,500.00 |
| HM/2011/14 | කලවාන | නිවිතිගල රෝහලේ සායන ගොඩනැගිල්ල අළුත්වැඩියාව | C 8 | රු.2,000.00 |

02. සබරගමුව පළාත් සභාවේ හෝ ඉදි කිරීම් කර්මාන්ත පුහුණු හා සංවර්ධන ආයතනයේ ගොඩනැගිලි විෂය යටතේ ඉහත සඳහන් වටිනාකමට හෝ ඊට වැඩි වටිනාකමට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවෝ ටෙන්ඩර් අයදුම් කිරීමට සුදුස්සෝ වෙති.

03. 2011 අගෝස්තු මස 03 දින සිට අගෝස්තු මස 24 දින දක්වා, සතියේ වැඩ කරන දින වල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා මෙම කාර්යාලයේ ගිණුම් අංශයෙන් ඉහත සඳහන් පරිදි ගාස්තු ගෙවීමෙන් ප්‍රසම්පාදන ලේඛණ ලබා ගත හැකිය.

04. සියලුම ලංසුකරුවන් ටෙන්ඩර් කොන්දේසිවලට අනුකූලව ලංසු බැදුම්කර වශයෙන් පිළිගත් වානිජ බැංකුවකින් ලබාගත් බැදුම්කරයක් හෝ අමාත්‍යාංශ ලේකම් වෙත අදාළ මුදල් බැර කර ලබා ගත් රිසිට් පත ලංසු ලේඛණ සමඟ ඉදිරිපත් කළ යුතු අතර සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන 2011. අගෝස්තු මස 25 දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අමාත්‍යංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුය. සෑම ටෙන්ඩරයක් සඳහාම අනුපිටපතක් ඒ බව කවරයේ සඳහන් කරමින් වෙනම කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

05. 2011.08.25 දින පෙ.ව. 10.15 ට ලංසු පත් විවෘත කරනු ලබන අතර, ලංසු කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

06. මෙම ලංසු කැඳවීම සම්බන්ධයෙන් පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් කාර්යාල වේලාවන් තුළදී අවශ්‍ය විස්තර අමාත්‍යාංශ කාර්යාලයෙන් ලබා ගත හැකි අතර සාර්ථක ලංසු කරුවන්ට ලංසු පිරිනැමීම ඔවුන්ගේ ලියාපදිංචි වටිනාකමට සීමා කරුණු ඇත. ටෙන්ඩර් පත් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර අවසන් තීරණය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

07. මෙම දැන්වීම අන්තර්ජාලයේ www.sg.gov.lk ලිපිනයෙන් ද ලබා ගත හැකිය.


සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සහ
වනිතා කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව,
නව නගරය, රත්නපුර


2011 අගෝස්තු මස 01


දුක.අ. – 045 - 2222542